කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය
වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය
වාණිජ විද්‍යාවේදි (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)- 2012
2015 පෙබරවාරි

**BCOME 4564** - බැංකු නීතිය හා පරිචය

ප්‍රශ්න සංඛ්‍යාව : (අටයි) 08 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්නය පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. ගනුදෙනු කළහැකි ලියවිලි වලට අදාලව පහත සඳහන් දෑ පැහැදිලි කරන්න.

අ. ගනුදෙනු කළහැකි ලියවිලි වලට නිදසුන්

ආ. ගනුදෙනු කළ හැකි ලියවිලි වල පොදු ලක්ෂණ

ඇ. විනිමය බිල්පත් ගනුදෙනු කිරීම.

ඉ. ගනුදෙනු කළහැකි බව නම් සිද්ධාන්තය.

(මුළු ලකුණු 20)

02. ශ්‍රී ලංකා බැංකු නීතියේ මූලාශ්‍රයක් ලෙස ව්‍යවස්ථා නීතියේ භාවිතය සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 20)

03. අ. චෙක්පත කට ගෙවීම් කිරීමේදී ගෙවන බැංකුකරු අවධානය යොමු කළයුතු කරුණු විස්තර කරන්න.

(ලකුණු 12)

ආ. ගෙවන බැංකු කරුට සැලසෙන ව්‍යවස්ථාපිත රැකවරණ සහ ඒවා ගෙවන බැංකු කරුට අහිමි වන අවස්ථා විස්තර කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

04. අ. " ගනුදෙනු කළ නොහැකියි " යනුවෙන් රේඛීක රු. 10,000/- ක් සඳහා වූ චෙක්පතක් " එක්ස් " විසින් " වයි " වෙත නිකුත් කර ඇත. " වයි " ගෙන් මෙම චෙක්පත සොරාගත් සුනිල්, වෙළෙන්දෙකු වන උපාලිට මෙම චෙක්පත, පවරා දී, ඒ සඳහා වටිනාකමට භාණ්ඩ ලබාගෙන ඇත. උපාලි මෙම සොරකම ගැන දැන සිටියේ නැත.

උපාලි මෙම චෙක්පත සඳහා බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගෙන ඇත. මෙම චෙක්පත සම්බන්ධව ඉහත පාර්ශවයන්ගේ නෛතික තත්ත්වය සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 20)

05. " බැංකුකරු හා ගනුදෙනු කරු අතර පවතින සබඳතාවය ගිවිසුම් සබඳතාවයකි. ඒහා සබැඳි තවත් සබඳතා කීපයක් දෙපාර්ශවය අතර පැන නැග ඇත. වඩාත්දුරට, මෙම සබඳතාවය නිසා විශේෂ අයිතිවාසිකම් හා යුතුකම් ගණනාවක් දෙපාර්ශවය අතර හට ගෙන තිබේ. " සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 20)

06. බැංකු නීතියෙහි " බැංකු කරු " යන වචනය විස්තර කොට, ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු වල සම්ප්‍රදායික බැංකු කටයුතු හා ඊට අමතරව, එම බැංකු වර්තමානයේදී ඉටු කරන වෙනත් කාර්යයන් විස්තර කරන්න.

(මුළු ලකුණු 20)

07. අ. සිරිමල් ප්‍රවාහන සමාගම, එච්.එම්. සරත් විසින් එම සමාගම වෙත සපයන ලද භාණ්ඩ වෙනුවෙන්, ඔහුට රු. 25,000/- සඳහා වූ චෙක්පතක් නිකුත් කළේය. සරත් එම චෙක්පත, " සරත්, " යනුවෙන් පිටසන් කොට වටිනා ප්‍රතිශ්ඨාවක් සඳහා ප්‍රභාත් ට දුන්නේය.

i. මෙහි වලංගු පිටසනක් තිබේද ? හේතු දක්වන්න.

( ලකුණු 02)

ii. ප්‍රභාත්ගේ නෛකික තත්ත්වය කුමක්ද ?

( ලකුණු 03)

iii. " චෙක්පත " නිර්වචනය කරන්න.

( ලකුණු 05)

ආ. චෙක්පතක් රේඛනයෙහි වාසි විස්තර කොට, රේඛන වර්ග සහ ඒවාට බලපාන රීති විස්තර කරන්න.

( ලකුණු 10)

(මුළු ලකුණු 20)

08. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් පිළිබඳ සටහන් ලියන්න.

අ. යථා කාලීන ධාරක

ආ. ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය.

ඇ. බැංකු කටයුතු වලට අදාලව ශ්‍රී ලංකා මහා බැංකුවේ කාර්ය භාරය.

( ලකුණු 10 බැගින් )

(මුළු ලකුණු 20)